රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ - 25/2001

මගේ අංකය :ආ/III/2/3-3
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,, පළාත් සභා,
පළාත් පාලන හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
2001 ඔක්තෝබර් මස 18 වැනි දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

## 2001 පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීම සඳහා
## <u>අවශ්‍ය කාර්ය මණ්ඩලය</u>

2001 දෙසැම්බර් 05 වන දින පැවැත්වෙන පාර්ලිමේන්තු මැතිවරණය සඳහා මැතිවරණ කොමසාරිස්වරයාට සහ තේරීම් භාර නිලධාරීන්ට, පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් ද ඇතුළුව සමස්ත රාජ්‍ය සේවයේම නිලධාරීන්ගේ සහාය, අත්‍යාවශ්‍ය වේ. මැතිවරණ රාජකාරි සඳහා හඳුනා ගනු ලබන නිලධාරීන් පමණක් නොව සෙසු සියළුම නිලධාරීන් ද අවශ්‍යතාවයක් පැන නැගුණහොත් සේවයේ යෙදීම සඳහා සූදානමින් සිටිය යුතු ය.

02. එහෙයින් පහත දැක්වෙන ක්‍රියාමාර්ග ගතයුතු බව රජය විසින් තීරණය කර ඇත.

(අ) 2001.11.20 සිට 2001.12.10 දක්වා (දෙදිනම ඇතුළුව) කාලය තුල රජයේ සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ට නිවාඩු අනුමත නොකල යුතු අතර මෙම කාලය සඳහා දැනටමත් නිවාඩු අනුමත කර ඇත්නම් එම නිවාඩු අවලංගු කර ඇති සේ සැලකිය යුතුය. නිලධාරියෙකු රෝගාතුර වීම වැනි අතිශයින්ම විශේෂ වූ කරුණක් සම්බන්ධයෙන් නිවාඩු ලබාදීම පිළිබඳව පෞද්ගලිකව අදාල අමාත්‍යාංශයේ ලේකම් හෝ පළාත් සභා ප්‍රධාන ලේකම් විසින් තීරණයක් ලබා දිය යුතුය.

(ආ) විදේශ දූත මණ්ඩල සමග නිල සාකච්ඡා පැවැත්වීම, සම්මන්ත්‍රණ සම්මේලන හා පුහුණු වැඩ සටහන් ආදිය සංවිධානය කිරීමේදී ඉහත සඳහන් කාලය තුල නිලධාරීන් මැතිවරණ රාජකාරි සඳහා යොදවා ගැනීමට බාධාවක් නොවන අන්දමින් ඒවා සංවිධානය කිරීමට සියළුම අමාත්‍යාංශ හා පළාත් සභා විසින් කටයුතු කල යුතු වේ.

(ඇ) කිසියම් අති විශේෂ පෞද්ගලික අවශ්‍යතා මත දිනයක් හෝ දෙකක් වැනි කෙටි කාලසීමාවකට නිවාඩු අවශ්‍ය වන්නේ නම් මැතිවරණ පත්වීම් ලිපි භාර ගැනීමට, තැපෑලෙන් ඡන්දය ප්‍රකාශ කිරීමට හා උපදෙස් පන්තිවලට සහභාගී වීමට බාධාවක් නොවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අභිමතය පරිදි නිවාඩු අනුමත කළ හැක.

03. මෙම චක්‍රලේඛය නිකුත් කරනුයේ මැතිවරණ කොමසාරිස්ගේ අදහස් විමසීමෙන් පසුවය.

04. ඉහත පරිදි කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලෙසත් එම විධිවිධාන ඔබ අමාත්‍යාංශයේ / ආයතනයේ සියළුම නිලධාරීන්ට දැන ගැනීමට සලස්වන ලෙසත් කාරුණිකව දන්වමි.

එම්.එන්.ජුනයිඩ්
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන
සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය